# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/167/2025 (PSC)

**පී.පී.ප්‍රමිත් සංකල්ප**
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.03.26**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක වෙනුවෙන් නීතිඥ ඒ.එම්.මහේෂ් රත්නායක මහතා
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් කේ.මනේෂා නිශ්ශංක මිය.

## -නියෝගය-

පී.පී.ප්‍රමිත් සංකල්ප යන අභියාචක විසින්, 2025.07.08 දිනැතිව ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමෙන් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත නිකුත් කර ඇති තනතුර හැරයාමේ නිවේදනය බල රහිත කොට, නැවත සේවයේ පිහිටුවන ලෙසයි. මාතර ප්‍රධාන තැපැල් අධිකාරී විසින් අභියාචක වෙත නිකුත් කර ඇති 2022.08.30 දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ, 2022.08.26 දින සිට අභියාචක තනතුර අතහැර ගියාසේ සළකන බවයි. එම නියෝගයට එරෙහිව අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනය සළකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.06.11 දිනැති ලිපිය මගින් අභියාචක වෙත දන්වා ඇත්තේ, ඔහු විසින් 2023.02.18 දිනැතිව ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කර ඇති බවයි. එසේ නම් මෙහිදී සළකා බැලිය යුත්තේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගෙන ඇති තීරණයෙහි නිරවද්‍යතාවය පිළිබඳවයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති 2026.03.05 දිනැති වාර්තාවෙහි 04 වන ඡේදයේ සඳහන් කර ඇත්තේ, අභියාචක විසින් 2022.06.15

වෙනි දින අසනීප නිවාඩු වාර්තා කර, එය සනාථ කිරීම සඳහා මාතර මහ රෝහලෙන් නිකුත් කර ඇති වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර ඇති බවයි. එම වෛද්‍ය සහතිකය ඇමුණුම 06 ලෙස අමුණා ඉහත කී වාර්තාව සමඟ අමුණා ඇත. එම වෛද්‍ය වාර්තාවට අනුව 2022.06.15 වෙනි දින සිට දින 14ක් සඳහා අභියාචක සම්බන්ධයෙන් වෛද්‍ය නිවාඩු නිර්දේශ කරන බවට එහි සඳහන් කර ඇත. එම කරුණ එනම් ඔහුගේ අසනීප තත්ත්වය, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයෙහි කිසිම තැනක සඳහන් කර නැත. ඔහු විසින් ඉදිරිපත් කර ඇති, 2025.06.24 දින යොදා ඇති අභියාචනා පෙත්සමේ 02 වන ඡේදයේ සඳහන් කර ඇත්තේ, ඔහු රාජකාරියට වාර්තා කර නොබෝ දිනකින් මාරාන්තික ඩෙංගු රෝගය වැළදීමෙන් නේවාසිකව ප්‍රතිකාර ලැබූ බවයි. ඉන් අනතුරුව තවදුරටත් ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත් බවට එහි සඳහන් කර ඇත. අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන සමඟ ඇමුණුම් 02 ලෙස අමුණන ලද වෛද්‍ය වාර්තාවක්ද ඉදිරිපත් කර ඇත. එකී වෛද්‍ය වාර්තාව හොරන්ගල්ලේ පේමසිරි හිමි විසින් නිකුත් කර ඇත. එකී වෛද්‍ය සහතිකයේ සඳහන් කර ඇත්තේ, 2022.07.06 දින සිට 2022.09.09 දින දක්වා කාලයට අභියාචකට අසනීප නිවාඩු අවශ්‍ය බවයි. එහි සඳහන් කර ඇති අසනීපයට හේතුව වන්නේ, වම් කකුලේ මහපටගිල්ල සර්පයෙකු දෂ්ඨ කර තිබීම යන්නයි. එම කරුණ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අභියාචනයේ කිසිදු තැනක සඳහන් කර නැත.

ඉහත කරුණු අනුව පෙනී යන්නේ, අභියාචක සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂි ඉදිරිපත් කර නොමැති බවයි. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති 2026.03.05 දිනැති වාර්තාවේ 04 ඡේදයේ සඳහන් කරුණුය. එහි සඳහන් වන්නේ, අභියාචක විසින් 2022.07.06 දිනැතිව එවන ලද ටෙලිමේල් පණිවිඩය මගින් අසනීප බව දන්වා ඇතත්, 2022.08.18 දින වන තෙක්ම ඔහු නැවත සේවයට වාර්තා කිරීමක් කර නොමැති බවයි. එය මාසයකටත් වඩා අධික කාල පරිච්ඡේදයකි. තවද 2022.08.19 දිනැති ලිපිය මගින් මාතර ප්‍රාදේශිය තැපැල් අධිකාරී විසින්, අභියාචක වෙත දන්වා ඇත්තේ ඔහු තවදුරටත් අසනීප නම් රජයේ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන ලෙසයි. එවැනි දැනුම් දීමක් අභියාචක වෙත කර තිබුණද, ඔහු විසින් සේවයට වාර්තා කර නොමැති හේතුවෙන්, 2022.08.30 දිනැති ලිපිය මගින් තනතුර හැරයාමේ නිවේදනය අභියාචක වෙත නිකුත් කර ඇත.

ඉහත කරුණු සළකා බැලීමේ දී පෙනී යන්නේ, අභියාචක 2022.06.28 දින සිට සේවයට වාර්තා කර නොමැති බවත්, එදින සිට සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්ෂියක් ඉදිරිපත් කර නොමැති බවත්ය. එම කරුණු සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමු.

මෙහිදී සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ, අභියාචක ඉහත සිද්ධිය වන අවස්ථාව වන විට, පරිවාස කාලය තුළ සේවය කරන ලද නිලධාරියෙකු වන බවත්, ඒ වන විට ඔහුගේ තනතුර ස්ථිර කර නොමැති බවටත්ය.

ඉහත හේතු සළකා බලා, අභියාචකගේ අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-